ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන **2017/2018**

අවසාන පරීක්ෂණය

**EPC1237/ESC1137**-පරිසර ගවේෂණය සහ සමෝධානිත ප්‍රවේශය

කාලය - පැය දෙකයි (02)

---

දිනය - **2019.06.14** වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'පරිසරය' යන පදය ඔබේ වචනවලින් පැහැදිලි කරන්න.

02. සමෝධානිත ප්‍රවේශය යනු කුමක් ද?

03. ජීවී දේවල සහ අජීවී දේවල් අතර වෙනස පැහැදිලි කරන්න.

04. පෙරපාසල් දරුවන් සඳහා ඔබ සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය හඳුනා ගැනීමට ඇගයීම් කළයුතු ක්ෂේත්‍ර පහක් (05) සඳහන් කරන්න.

05. පෙරපාසලක පරිසරමුල්ල (Nature corner) සහ ස්වභාවික කටුගෙයකින් (Nature Museum) ලබාගත හැකි වාසි හතරක් (04) ලැයිස්තුගත කරන්න.

06. සමෝධානිත වැඩසටහනක දී දරුවන් ක්‍රියාකාරකම්වල නිරත වන අවස්ථාවේදී නිරීක්ෂණය කරන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "පරිසර ගවේෂණයක් සඳහා පෙරපාසල් දරුවන්ට ගෙවත්තක් අවශ්‍ය වේ." ඔබ මෙම කියමන සමග එකඟවන්නේ ද හේතු ඉදිරිපත් කරන්න.

08. ගොඩබිම ජීවත්වන සතුන් වර්ග පහකට බෙදිය හැකිය. උදාහරණ ඉදිරිපත් කරමින් මෙම වර්ග ලැයිස්තුගත කරන්න.

(ලකුණු 5 x 8 =40)

## දෙවන කොටස

09. (a) "පරිසර" සංකල්ප ප්‍රධාන කොටස් දෙකකට **(02)** බෙදා දක්වන්න. (ලකුණු 04)

(b) ඔබ ඉහත සඳහන් කළ වර්ග දෙකෙන් එකක් තෝරාගෙන එය විස්තර කරන්න. (ලකුණු 08)

(c) ඔබ තෝරාගනු ලැබූ වර්ගය පිළිබඳ අත්දැකීම් ලබාදීම සඳහා යොදාගත හැකි ඉගැන්වීමේ ආධාරක දෙකක් **(02)** විස්තර කරන්න. (ලකුණු 08)

10. පහත දැක්වෙන ඕනෑම තේමාවක් තෝරාගෙන විස්තරාත්මක පාඩම් සැලැස්මක් සකස් කරන්න.

1. සතුන් 2. වැසි දිනයක් 3. වෙළඳපොල 4. ළමා උද්‍යානයක්

පහත සඳහන් දෑ ඔබේ පාඩම් සැලැස්මේ ඇතුලත් විය යුතුය.

(a) පාඩම් සැලැස්මට අදාල පසුබිම් තොරතුරු (තේමාව, දරුවන්ගේ වයස්, දරුවන් සංඛ්‍යාව)

(b) ක්‍රියාකාරකම්වල ස්වභාවය

(c) දරුවන් ක්‍රියාකාරකම්වල නිරතවීම

(d) ඉගෙනුම් සම්පත් (ලකුණු 5 x 4= 20)

11. (i) විෂයානුබද්ධ ප්‍රවේශය සහ තේමා ප්‍රවේශයේ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) "සමෝධානිත ප්‍රවේශය තුළින් සිසුන්ට යථාර්ථය පිළිබඳ එකමුතුකම සහ සැබෑ ජීවන දක්ෂතා ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීමට හැකි වේ."

මෙම ඉහත කියමන සමග ඔබ එකඟ වන්නේ ද? උචිත උදාහරණ පහක් **(05)** දක්වමින් ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

12. (i) "අපට උදව් කරන මිනිස්සු" මෙම තේමාව යටතේ පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර සඳහා එක් සංකල්පයක් බැගින් තෝරා ගන්න.

(a) පූර්ව - භාෂා සංවර්ධනය (c) පරිසරය

(b) පූර්ව ගණිත සංකල්ප (d) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්

(ලකුණු 10)

(ii) පෙරපාසල තුළ ඉහත සඳහන් කළ සංකල්ප වර්ධනය කිරීමට සමෝධානි ප්‍රවේශය භාවිත කරමින් එක් දිනක වැඩ සටහනක ක්‍රියාකාරකම් සංවිධානය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පරිසර ගවේෂණයේ දී පෙරපාසල් දරුවන් නිරීක්ෂණයට යොදාගත හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පෙරපාසල් දරුවන් පන්ති කාමරය තුළ පරිසර මුල්ල නිරීක්ෂණයට හා ඉගෙනුමට යොදා ගන්නා ආකාරය සංවිධානය කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පෙරපාසල් දරුවන්ට පරිසර ගවේෂණය සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගන්න. එම ගවේෂණයෙහි ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 04)

(iv) ඉහත තෝරාගත් ස්ථානයෙහි පෙරපාසල් දරුවන්ට නිරීක්ෂණය තුළින් සැබෑ අත්දැකීම් ලබා දීමට පෙරපාසල් ගුරුවරයාට කළ හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

හිමිකම් ඇවිරිණි.